

# ත්‍රිකුණාමල තෙල් ගබඩා සංකීර්ණයේ නිදාන කථාව

**චාමර ලක්ෂාන් කුමාර**

ඉඳහිට කතාබහට ලක්වන ත්‍රිකුණාමලයේ තෙල්ටැංකි පිළිබඳ කතිකාවක් ගෙවුණු සතියේ රටේ ඇතිවුණේ, ඛනිජ තෙල් සංස්ථා සේවකයන් දියත් කළ එක්දින වැඩ වැරුමත් සම[illegible]ය. වර්ජනයට විෂය වූ කරුණු කාරණා අතර ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි පිළිබඳ කාරණයක් ද විය.

නැගෙනහිර පළාතේ පිහිටි ත්‍රිකුණාමලය අතිශය වැදගත් මර්මස්ථානයක් වී ඇත්තේ මූලිකවම එහි භූදේශපාලනික වැදගත්කම නිසා ය. මේ වැදගත්කම අද ඊයේ ඇතිවූවක් නොවේ. සියවස් ගණනක් ආපස්සට ගමන්කරන්නකි. ත්‍රිකුණාමලයේ අයිතිය ඇත්තා ඉන්දියන් සාගරය හසුරුවන බවට ප්‍රබල මතයක් සමාජගත වී පැවතීමෙන් මෙහි ඇති භූදේශපාලනික වැදගත්කම මනාව පිළිබිඹු වෙයි. ඒ නිසාම ඍජුව කෙසේ වෙතත් වක්‍රාකාරයෙන් හෝ ත්‍රිකුණාමලය තම පාලනය යටතේ තබා ගැනීමට බොහෝ දෙනා උනන්දු වූහ. ඒ සම්බන්ධව අපගේ අසල්වැසි ඉන්දියාවට තිබූ උනන්දුව අතිශය තාර්කික වූවක් ම විය. වෙනෙකක් තබා උතුරේ සිට වෙනම රාජ්‍යයක් බිහි කිරීමට සිහිනදුටු ප්‍රභාකරන් පවා තම ඊලාම් රාජ්‍යයේ අගනුවර ලෙස තෝරාගෙන තිබුණේ ත්‍රිකුණාමලය ය.

ත්‍රිකුණාමලයේ භූ දේශපාලනික වැදගත්කම ඉහළ නංවන ප්‍රධානතම කාරණය වනුයේ, එහි ඇති වරාය ය. කිලෝමීටර් 56ක් පුරා පැතිරුණු වෙරළ තීරයක් සහිත ත්‍රිකුණාමල වරාය, ලොව හොඳම හා විශාලතම ස්වාභාවික වරායන් අතරින් එකක් ලෙස සැලකෙයි. නැගෙනහිර පළාතේ අගනුවර සේ සැලකෙන ත්‍රිකුණාමලයට විශේෂත්වයක් ගෙනෙන තවත් කාරණයක් වනුයේ චීන වරායෙහි පිහිටි තෙල් ගබඩා සංකීර්ණය ය. බටහිර ආසියාව හා සිංගප්පූරුව අතර ඇති විශාලතම තෙල් ගබඩා සංකීර්ණය එයයි. ඓතිහාසික හා ඉහළ උපායික වටිනාකමක් සහිත ත්‍රිකුණාමල තෙල් ගබඩා සංකීර්ණය දෙවැනි ලෝක යුද්ධයේ දී මිත්‍ර හමුදා විසින් දකුණු හා අග්නිදිග ආසියාවේ මෙහෙයුම් සඳහා ප්‍රයෝජනයට ගැනීමට මනා සැලැස්මක් යටතේ ඉදිකරනු ලැබූ අතර, 1924 වසරේ දී පමණ ඉදිකිරීම් වැඩ අරඹා නවසිය තිහේ දශකයේ අගභාගය වන විට තෙල් ගබඩා සංකීර්ණයේ වැඩකටයුතු අවසන්ව ඇත. මුල් සැලැස්මට අනුව තෙල් ටැංකි 102ක් ඉදිකිරීමට නියමිතව පැවති මුත්, මිථ්‍යා විශ්වාස පෙරදැරිව 100 වන ටැංකිය ඉදිකර නොමැත. දැව්තෙල් ඩීසල් හා භූමිතෙල් ගබඩා කළ හැකි මෙහි එක් ටැංකියක ඉන්ධන ටොන් 12000 ක් පමණ ගබඩා කිරීමේ හැකියාව පවතී. ඒ අනුව එහි සමස්ත ධාරිතාව මිලියන 1.2 සීමාව ඉක්මවයි. එම ඉහළ ඉලක්කම්, ඛනිජ තෙල් සංස්ථාව සතු ඉන්ධන ගබඩා පහසුකම් අඟුටුමිට්ටෙකු බවට පත් කර ඇත. අක්කර 850 ක වපසරියක් පුරා පැතිර ඇති ගබඩා සංකීර්ණය Lower Tank හා Upper Tank යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර, ජැටියේ සිට කිලෝමීටර් දෙකක් ඇතුළත upper Tank හී අවසන් තෙල් ටැංකිය පිහිටා ඇත. සෙස්ස ඇත්තේ ඇතුළට වන්නට ය. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය යටතේ පැවති, අප්‍රිකානු රටවල්වල කම්කරුවන්ගේ ශ්‍රම දායකත්වය මතින් ගොඩනැගුණු ත්‍රිකුණාමල තෙල් ටැංකි සංකීර්ණය II වන ලෝක යුද්ධයේදී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය භාරයේ පැවති විශාලතම තෙල් ගබඩාව විය. මිත්‍ර හමුදාවන් හා සම්බන්ධ අතිශය තීරණාත්මක සැපයුම් හා මෙහෙයුම් මධ්‍යස්ථානයක් වූ නිසාම මෙය දෙවන ලෝක යුද්ධයේදී ප්‍රධාන සතුරු ඉලක්කයක් බවට නිතැතින්ම පත්විණි.

කොළඹට බෝම්බ හෙළා දින 04 කට පසු ත්‍රිකුණාමලය තම ඉලක්කය විය යුතු බවට ජපන්නු තීරණය කළහ. ඇතැම්විට කොළඹ ප්‍රහාරය, ත්‍රිකුණාමල ප්‍රහාරයේ පෙරහුරුවක් ලෙස අනුමාන කළ හැකි ය. ත්‍රිකුණාමල ප්‍රහාරය තුළ දී ජපනුන්ගේ ප්‍රධාන අරමුණ වූයේ වරාය හා තෙල් ටැංකි සංකීර්ණය ය. ඒ අනුව

**බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස් වූ පසු මෙහි අයිතිය ලංකාවට හිමි වුවත් එහි සම්පූර්ණ ධාරිතාව භාවිතා කිරීමට තරම් විභවතාවක් අවශ්‍යතාවක් කිසිදා අපට තිබී නොමැත. මුහුදට ළංව පිහිටි තෙල් ටැංකි හැරුණු විට සෙස්ස භාවිතයට නොගැනීම තුළ සැබවින් ම සිදුවූයේ ස්වභාවධර්මය විසින් එය ආක්‍රමණය කෙරුම ඇරඹීමය.**

1942 අප්‍රේල් නමවැනිදා, ජපන් ප්‍රහාරක යානාවක් තෙල් ටැංකි සංකීර්ණයට ප්‍රහාර එල්ල කළ මුත්, ප්‍රතිප්‍රහාර සඳහා ද සූදානමක් තිබූ බැවින් එය අසාර්ථක විය. ප්‍රතිප්‍රහාර දරුණුවෙත් ම ජපන් යානාවේ නියමුවා වූ ෂිජෙනෝරි වටනාබේ, තම කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ද සමගින් 91 වන ටැංකියේ තම යානය හැප්පවීමට කටයුතු කළ බව කියවෙයි. එය එක්තරා ආකාරයක

8 වන පිටට

මෙම ස්ථානයේ වෙළඳ දැන්වීම් සඳහා විමසන්න - අසෝක 0432 391 922




සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
sjturaus@optusnet.com.au

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

**වැදගත්**

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත